සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 87 | S | I |
|---|---|---|---|---|

නම: ..........................................

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

කාලය පැය තුනයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න

01. පැලියොලිතික් යුගය ලෙස හඳුන්වන්නේ,
 1. නූතන යුගයයි. 2. ප්‍රාග් ඓතිහාසික යුගයයි.
 3. මධ්‍යතන යුගයයි. 4. පොළොන්නරු යුගයයි.

02. නිර්වාචික සන්නිවේදනයට අනුව ඔබේ යහළු යෙහෙළියන් අයත් වන සමාජ අවකාශය වන්නේ,
 1. සහෘද අවකාශයටයි. 2. පොදු දුර අවකාශයටයි.
 3. සාමාජීය අවකාශයටයි. 4. පෞද්ගලික අවකාශයටයි.

03. www.doenets.lk යන වෙබ් අඩවිය අයත් වන්නේ,
 1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට ය. 2. අධ්‍යාපන අමාත්‍යාංශයට ය.
 3. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ය. 4. ජාතික අධ්‍යාපන ආයතනයට ය.

04. රූපවාහිනී මාධ්‍යයේ නව ප්‍රවණතාවයක් නොවන්නේ,
 1. විවිධ හැඩයේ රූපවාහිනී නිර්මාණය වීමයි. 2. ඇනලොග් තාක්ෂණය භාවිත වීමයි.
 3. වැඩි නාලිකා ප්‍රමාණයක් නැරඹිය හැකි වීමයි. 4. අතේ ගෙන යා හැකි උපාංගයක් වීමයි.

05. මූලික වශයෙන් ඒක මාර්ගික සන්නිවේදන ක්‍රියාවලියක් දක්නට ලැබෙන්නේ කුමන සන්නිවේදන ප්‍රභේදයේ ද?
 1. අන්තර් පුද්ගල සන්නිවේදනය 2. සමූහ සන්නිවේදනය
 3. ජනසන්නිවේදනය 4. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය

06. බස් රථ රියදුරෙකු වූ නිමල්ට වඩාත් වැදගත් වන සන්නිවේදන ස්වරූප ඇතුළත් වරණය තෝරන්න.
 1. වාචික හා ශ්‍රව්‍ය සන්නිවේදනය 2. වාචික හා දෘශ්‍ය සන්නිවේදනය
 3. නිර්වාචික හා දෘශ්‍ය සන්නිවේදනය 4. නිර්වාචික හා අවිධිමත් සන්නිවේදනය

07. කාර්යාල, ව්‍යාපාර, ගොඩනැගිලි, නගර ආරක්ෂාව සඳහා බහුල වශයෙන් යොදා ගන්නා මාධ්‍ය උපකරණයක් වන්නේ,
 1. සංවෘත පරිපථ සහිත රූපවාහිනී කැමරායි. 2. අංකිත රූපවාහිනී කැමරායි.
 3. විද්‍යුත් පිරික්සුම් උපකරණයි. 4. ප්‍රක්ෂේපණ මාධ්‍ය උපකරණයි.

08. ජනමාධ්‍යයේ සාමාජීය නියෝජනයට අයත් නොවන්නේ,
 1. වාර්ගිකත්වයයි. 2. සමාජ ප්‍රතිරූපයයි. 3. පවුලයි. 4. පුරවැසිභාවයයි.

09. SLR කැමරාවේ ලක්ෂණයක් නොවන්නේ,
 1. අවශ්‍ය පරිදි කැමරා කාච මාරු කරගත හැකි වීමයි.
 2. ඡායාරූප ශිල්පියා දර්ශන දෘක්මෙන් දකින රූප රාමුව ම රූප ගත වීමයි.
 3. ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වීමයි.
 4. අවශ්‍ය පරිදි හැසිරවිය හැකි වීමයි.

10. එක්තරා පුවත්පතකට වාර්තා කර තිබූ තොරතුරක් පිළිබඳව බොහෝ දෙනාගේ පිළිගැනීමක් නොවීය. තොරතුරක මනා පිළිගැනීමක් ඇති වීමට බලපාන සාධකය මින් කුමක් ද?
 1.කාලීන බව 2. අපූර්ව බව 3. සමතුලිත බව 4. අදාළ බව

11. ගුවන්විදුලි හා රූපවාහිනී මාධ්‍ය සැසඳීමේ දී රූපවාහිනී මාධ්‍යයේ සුවිශේෂත්වය වන්නේ,
 1. තිර පිටපතක් යොදා ගැනීමයි. 2. තාක්ෂණික ක්‍රියාවලියක් පැවතීමයි.
 3. මැදිරි නිෂ්පාදන ඉදිරිපත් කිරීමයි. 4. වේශ නිරූපණය හා පසුතල නිර්මාණ කිරීමයි.

12. ඉගෙනුම් ක්‍රියාවලියේ දී සිසු අවධානය රඳවා තබා ගැනීම සඳහා පහසුවෙන් ම යොදාගත හැකි උපක්‍රමය වන්නේ,
   1. F.M. මයික්‍රෝෆෝනයක් භාවිත කිරීමයි.
   2. ප්‍රක්ෂේපණ යන්ත්‍ර භාවිත කිරීමයි.
   3. පිටු පෙරලනයක් භාවිත කිරීමයි.
   4. ප්‍රදීපාගාර උපක්‍රමය භාවිත කිරීමයි.

13. පහත කරුණු සලකන්න.
   A - පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන යාම.
   B - කාලය සන්නිවේදනය කිරීම.
   C - ඉගෙනුම හා ඉගැන්වීම.
   D - බලවත් ආවේග පිට කිරීම.
   ඉහත කරුණු අතරින් භාෂාවේ මූලික කාර්යයන් වන්නේ,
   1. A හා B පමණි.
   2. A හා D පමණි.
   3. B හා C පමණි.
   4. C හා D පමණි.

14. විදුහල්පතිතුමාගේ කාර්යාලීය කාමරය තුළ අවශ්‍යයෙන් ම තිබිය යුතු මාධ්‍ය උපකරණ ඇතුළත් පිළිතුර තෝරන්න.
   1. නිල මුද්‍රාව, දුරකතනය, ගණක යන්ත්‍රය
   2. නිල මුද්‍රාව, දුරකථනය, විද්‍යුත් තැපැල
   3. නිල මුද්‍රාව, දින මුද්‍රාව, ගණක යන්ත්‍රය
   4. දින මුද්‍රාව, පරිගණකය, සංවෘත පරිපථ රූපවාහිනී කැමරා

15. මාණ්ඩලික මාධ්‍යවේදියා පිළිබඳ ව නිදොස් ප්‍රකාශය වන්නේ,
   1. ආයතනය සමඟ ගිවිසුම්ගතව සේවය කිරීමයි.
   2. තම සේවාවට සරිලන වැටුපක් ලැබීමයි.
   3. වැටුපට අමතරව වරප්‍රසාද හිමි වීමයි.
   4. වෘත්තීන් දෙකක නිරත විය හැකි වීමයි.

16. සහජීවනයෙන් යුතුව ජීවත්වීම, ළමා හා කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා වීම සිදු වන්නේ,
   1. ප්‍රජාතන්ත්‍රවාදයෙනි.
   2. පුරවැසිභාවයෙනි.
   3. මානව හිමිකම් හා වගකීම් වලිනි.
   4. මානව ධර්මතාවලිනි.

17. දුෂාන් අධ්‍යාපන චාරිකාව ගොස් ලබා ගත් ඡායාරූප කිහිපයක්ම දැඩි සූර්යාලෝක සහිත ස්ථානයක සිට ඡායාරූපගත කිරීම නිසා එහි අඳුරු සහිත තද සෙවනැලි දක්නට ලැබුණි. ඊට හේතු වී ඇත්තේ,
   1. කාච විවරය විශාල කර ඡායාරූප ගැනීමයි.
   2. විද්‍යුත් ක්ෂණිකාලෝක භාවිත නොකිරීමයි.
   3. ක්ෂේත්‍ර ගැඹුර අඩු කර ඡායාරූප ගැනීමයි.
   4. විභේදන බලය අඩු වීමයි.

18. ටැබ්ලොයිඩ් පුවත්පතක් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,
   1. මෘදු සංවේදී තොරතුරු ඇතුළත් වීමයි.
   2. සංකීර්ණ තේමාවලින් යුතු තොරතුරු ඇතුළත් වීමයි.
   3. කුඩා පිටු සහිත වීමයි.
   4. ඡායාරූප වැඩි ප්‍රමාණයක් පැවතීමයි.

19. ආසියාවේ ප්‍රථම ගුවන් විදුලි සේවය විවෘත කරනු ලබන්නේ,
   1. ශ්‍රීමත් හියු ක්ලිෆඩ් මහතා ය.
   2. ගුග්ලිඑල්මෝ මාර්කෝනි මහතා ය.
   3. එඩ්වඩ් හාපර් මහතා ය.
   4. ලැම්ප්සන් මහතා ය.

20. මාධ්‍ය සංදේශයක ඇතුළත් තොරතුරු සමාජයට හිතකාමී ලෙස මෙහෙය වීම සඳහා මාධ්‍යවේදීන්ට වැදගත් වන ලියවිල්ලක් වන්නේ,
   1. මානව හිමිකම් නීතියයි.
   2. ප්‍රකාශන හිමිකම් නීතියයි.
   3. ආචාර ධර්ම මාලාවයි.
   4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.

21. පුවත්පත් වාර්තාවක් හෝ ලිපියක් මඟින් යමෙකුට හානියක් සිදු වූ විට පැමිණිලි කරන්නේ,
   1. මානව හිමිකම් කොමිසමටයි.
   2. පුවත්පත් ආයතනයටයි.
   3. පුවත්පත් කර්තෘ සංසදයටයි .
   4. පුවත්පත් පැමිණිලි කොමිසමටයි.

22. මාධ්‍ය හා මාධ්‍ය සංදේශවල සැබෑ ස්වභාවය ග්‍රාහකයා වෙත හඳුන්වා දීම සඳහා දායක වනුයේ,
   1. සන්නිවේදකයා ය.
   2. විචාරකයා ය.
   3. ජනමාධ්‍යකරුවා ය.
   4. නිර්මාණකරුවා ය.

23. අමරදේව මහතා විසින් ගායනා කළ "සන්නාලියනේ ......" ගීතය ඇසූ සඳමාලි එහි රසය හඳුනාගෙන මනා ලෙස විඳගත්තාය. ඇය සතු එම හැකියාව
   1. පරිකල්පනයයි.
   2. සංජානනයයි.
   3. රසඥතාවයයි.
   4. නිර්මාණාත්මක චින්තනයයි.

24. සාර්ථක ඡායාරූපයක ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?
   1. නිසි මොහොත සටහන් වී තිබීම.
   2. ස්වර්ණමය රීතිය භාවිත කිරීම.
   3. පැහැ අන්තරය කෙරෙහි අවධානය යොමු කිරීම.
   4. අවට සියලු තොරතුරු ඇතුළත් ව තිබීම.

25. නිශ්චල ඡායාරූප
A - විෂය මූලික අවශ්‍යතාවයක් ලෙස භාවිත කරයි.
B - රසායනික පැසුරුම්කරණයට භාජනය කෙරෙයි.
C - මුද්‍රිත මාධ්‍යයේ දී අදහස් ප්‍රබල ව විශ්වසනීයව ඉදිරිපත් කරයි.
ඉහත ප්‍රකාශනවලින්
1. A පමණක් සත්‍ය වේ. 2. A හා C පමණක් සත්‍ය වේ.
3. B පමණක් සත්‍ය වේ. 4. A,B හා C යන සියල්ලම සත්‍ය වේ.

26. දෙමව්පියන් විසින් තම දරුවන්ට සමාජ සිරිත් විරිත්, චර්යා, නීති රීති කියා දෙමින් සමාජයට හුරු කරයි. එමගින් සිදු කරන්නේ,
1. සමාජානුයෝජනයයි. 2. අධ්‍යාපනයයි. 3. පෙළඹවීමයි. 4. සංස්කෘතික විසරණයයි.

27. 'අය වැය හෙට' යනුවෙන් පුවත්පතක ප්‍රධාන ශීර්ෂ පාඨය දක්වා තිබුණි. එම ප්‍රවෘත්තියේ වටිනාකම තීරණය වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ,
1. කාලීන බවයි. 2. අදාළ බවයි. 3. බලපෑම හා වැදගත්කමයි. 4. සමීප බවයි.

28. වර්තමානයේ ලේක්හවුස් ආයතනය මඟින් ප්‍රකාශයට පත් කරන පුවත්පත් ඇතුළත් වරණය තෝරන්න.
1. සිළුමිණ, දිනමිණ, විජය 2. සිළුමිණ, දිනමිණ, මිහිර
3. ලංකාදීප, සිළුමිණ, මිහිර 4. මිහිර, දිවයින, ලංකාදීප

29. ගුවන් විදුලි පිටපත් රචකයෙකු වන කුමාරි පළමුවෙන්ම කළ යුතු වන්නේ මින් කුමක් ද?
1. වැඩසටහන ඉදිරිපත් කරන මාදිලිය හඳුනා ගැනීම. 2. වැඩසටහනේ පරමාර්ථ හඳුනා ගැනීම.
3. වැඩසටහන ඉදිරිපත් කරන ගුවන් කාලය හඳුනා ගැනීම. 4. තම ග්‍රාහක කණ්ඩායම හඳුනා ගැනීම.

30. වෙබ් ගුවන් විදුලිය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වනුයේ,
1. සරල ක්‍රියාවලියක් බවයි. 2. අඩු වියදම් ක්‍රමවේදයක් බවයි.
3. ගුවන්විදුලි තරංග සම්ප්‍රේෂණය මගින් සිදුවන බවයි. 4. වෙබ් අඩවියක් අවශ්‍ය බවයි.

31. කිසියම් තේමාවක් අරමුණක් පිළිබඳව පුද්ගලයන් සමූහයකගේ විවිධ අදහස් ඒකරාශී කර ගැනීමෙන් තොරතුරු රැස් කර ගන්නා ශිල්ප ක්‍රමය හඳුන්වන්නේ,
1. සම්මුඛ සාකච්ඡා ලෙසයි. 2. මාධ්‍ය සාකච්ඡා ලෙසයි.
3. විද්වත් සාකච්ඡා ලෙසයි. 4. බුද්ධි කලම්භනය ලෙසයි.

32. වෘත්තිමය සීමා හා සෞන්දර්යාත්මක නියම වෙනස් කරමින් බිහි වු නූතන රූපවාහිනී මාධ්‍යයේ විචිත්‍රාංගයමය වැඩසටහන් ප්‍රභේදයකි.
1. මෙගා නාට්‍ය වේ. 2. යථාකාර වැඩසටහන් වේ.
3. සඟරා වැඩසටහන් වේ. 4. වාර්තා වැඩසටහන් වේ.

33. පුවත්පත සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. නිර්මාණශීලී ආකෘති භාවිත කරයි.
2. දේශපාලන හා ආර්ථික තොරතුරු පමණක් ඉදිරිපත් කරයි.
3. යම් ක්ෂේත්‍රයක් හෝ පාඨක පිරිසක් අරමුණු කරගෙන පළ කරයි.
4. වෙළඳ දැන්වීම්, ප්‍රවෘත්ති, කතු වැකිය පුවත්පත් අන්තර්ගතයේ ප්‍රධාන කොටස් වෙයි.

34. සිසුන් ඉගෙන ගත් විෂයය කරුණු ඇසුරින් පන්ති කාමරය නිර්මාණශීලීව සකස් කරන ලෙස ගුරුතුමිය පැවසුවාය. ඒ සඳහා සිසුන්ට උපකාර වන්නේ,
1. ශ්‍රව්‍ය ප්‍රකාශන විධි ය. 2. දෘශ්‍ය ප්‍රකාශන විධි ය.
3. ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රකාශන විධි ය. 4. භාෂාත්මක ප්‍රකාශන විධි ය.

35. රූපවාහිනී මාධ්‍ය මගින් සමාජයට අවම බලපෑමක් කරන්නේ පහත සාධක අතුරින් කුමකට ද?
1. ප්‍රචණ්ඩත්වය 2. පරිභෝජනය 3. භාෂාව 4. සංස්කෘතිය

36. රමණි විසින් රචිත ග්‍රන්ථය නැවත මුද්‍රණය කරන වාරයක් පාසා ප්‍රකාශන ආයතනය මගින් ඇයට ගෙවීමක් කරයි. එම ගෙවීම හඳුන්වන්නේ,
1. කර්තෘ ලාභය ලෙසයි. 2. කර්තෘ අයිතිය ලෙසයි.
3. කර්තෘ භාගය ලෙසයි. 4. බුද්ධිමය දේපළ ලෙසයි.

37. 'පිටු 49 කට නොඅඩු වාර සඟරාවක් හෝ මුද්‍රිත කඩදාසි ගොනුව පොතක් වේ.' යනුවෙන් අර්ථ කථනය කළේ,
1. යුනෙස්කෝ ආයතනය යි. 2. එක්සත් ජාතීන්ගේ සංවිධානය යි.
3. පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යි. 4. ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය යි.

38. ප්‍රවෘත්ති සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. සෑම වැදගත් සිද්ධියක් ම ප්‍රවෘත්තියක් වේ.
2. සමාජය තුළ උනන්දුව ඇති කරන තොරතුරු වේ.
3. ජනමාධ්‍ය හරහා විකාශනය වේ.
4. වාර්තාකරු විසින් නිරීක්ෂණය කළ යුතු ම වේ.

39. පහත දැක්වෙන්නේ නිර්වාචික සන්නිවේදනය පිළිබඳ ඉදිරිපත් කළ මතවාද කිහිපයකි.
නිමාලි - දෙන්නෙක් අතට අත දීම නිර්වාචික සන්නිවේදනයට අයිති වෙනවා.
ගීතා - ඇයි, නිහඬබව, වචන උස් පහත් ලෙස උච්චාරණය කිරීමත් වැදගත්.
කමලා - ඒ විතරක් ද? ගන්ධය දැනීමත් නිර්වාචික සන්නිවේදනයට අයත්.
නීතා - ඇඳුම් පැළඳුම් මඟිනුත් වෙනවනේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිර්වාචික සන්නිවේදනය හා ගැළපෙන අදහස් ප්‍රකාශ කරන්නේ,
1. නිමාලි හා කමලා ය.
2. ගීතා හා නීතා ය.
3. නිමාලි, ගීතා හා නීතා ය.
4. නිමාලි, ගීතා, කමලා හා නීතා යන සියල්ලන්ම ය.

40. ළමයා හා මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අසත්‍ය ප්‍රකාශය වනුයේ,
1. ළමයින් ඉලක්ක කර ගත් බොහෝ සංදේශ ඉදිරිපත් කරයි.
2. ළමුන් සඳහා ජංගම දුරකථන, නවීන විලාසිතා, ඇඳුම් පැළඳුම් , රූපලාවන්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමට යෝජනා කරයි.
3. ළමයාට ඉහළ පාරිභෝගික වටිනාකමක් ලබා දෙයි.
4. පවුලෙන් , ආගමෙන් ලැබෙන ආභාසය හා සමාන වූ බලපෑමක් ජනමාධ්‍ය මඟින් ද සිදු කරයි.

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නට ලකුණු 20 ක් හිමි වන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

(01) සන්නිවේදනය යනු තොරතුරු ගනුදෙනුවකි.
i. ප්‍රාග් ඓතිහාසික යුගයේ භාවිත කළ සන්නිවේදන ක්‍රම දෙකක් ලියන්න.
ii. ග්‍රාහකයා වෙත යන සංදේශය පාලනය කිරීම හඳුන්වන නම කුමක් ද?
iii. නූතන දෘශ්‍ය මාධ්‍ය දෙකක් නම් කරන්න.
iv. ශ්‍රී ලංකාවේ පෞද්ගලික හිමිකාරීත්වය සතු පුවත්පත් මාධ්‍ය ආයතන දෙකක් දක්වන්න.
v. පුවත්පතක දෘශ්‍ය ආකර්ෂණය ඇති කරන විධි ක්‍රම දෙකක් සඳහන් කරන්න.
vi. තොරතුරු පරිහරණය කිරීමේ දී සැලකිය යුතු කරුණු දෙකක් සඳහන් කරන්න.
vii. සාර්ථක ගුවන් විදුලි වැඩසටහනක ලක්ෂණ දෙකක් දක්වන්න.
viii. ශ්‍රී ලංකාවේ මාධ්‍ය භාවිතයට අදාළ ආචාර ධර්ම පද්ධති දෙකක් නම් කරන්න.
ix. තොරතුරුමය හා සෞන්දර්යාත්මක ගුණයෙන් යුතු රූපවාහිනී වැඩසටහන් ප්‍රභේදය කුමක් ද?
x. මාධ්‍ය සංදේශයක් සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය අනුව ග්‍රාහකයා ප්‍රභේද කළ හැකි ආකාර දෙකක් දක්වන්න. (ල. 2x10=ල.20)

(02) i. සන්නිවේදන ක්‍රියාවලියක දී ග්‍රාහකයා තුළ ඇති වෙනස හඳුන්වන නම කුමක් ද? (ල. 01)
ii. තොරතුරු රැස් කිරීමේ දී යොදා ගන්නා නිරීක්ෂණයේ ප්‍රභේද දෙක දක්වන්න. (ල. 02)
iii. තොරතුරු රැස් කරන්නෙකු සතු විය යුතු පහත ගුණාංග කෙටියෙන් විස්තර කරන්න.
a. හොඳ නිරීක්ෂකයෙකු වීම.
b. ආචාරශීලී වීම
c. අපක්ෂපාතී බව (ල. 03)
iv. ආපදා සහිත අවස්ථාවක දී ජනමාධ්‍ය සන්නිවේදකයාගේ කාර්යභාරය කරුණු හතරක් ඔස්සේ පැහැදිලි කරන්න. (ල. 04)


(5) WWW.PastPapers.WiKi (4)
Download Term Test Papers, Short Notes From One Place!

(03) i. පාර්ලිමේන්තු පනතක් මඟින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා රූපවාහිනී ආයතනය නම් කරන්න. (ල. 01)

ii. රූපවාහිනී ටෙලි නාට්‍යයේ නවතම ප්‍රභේදයේ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (ල. 02)

iii. රූපවාහිනී මාධ්‍ය මඟින් සමාජයට කරන යහපත් බලපෑම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 03)

iv. රූපවාහිනී මාධ්‍යයේ ප්‍රවෘත්ති වැඩසටහන් සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට භාවිත කළ හැකි මූලාශ්‍ර හතරක් උදාහරණ ඇසුරින් විස්තර කරන්න. (ල. 04)

(04) i. පංචේන්ද්‍රයන් මඟින් ලැබෙන විවිධ සංදේශ ග්‍රහණය කරගෙන එය තේරුම් ගැනීම හැඳින්විය හැකි නම කුමක් ද? (ල. 01)

ii. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය පුද්ගල අභ්‍යන්තරය තුළ සිදු වුවද එය චර්යාව මඟින් ප්‍රකට වේ. එයට උදාහරණ දෙකක් දක්වන්න. (ල. 02)

iii. සිංහල අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් පැවැත්වීමට නියමිත බක්මහ උළෙල පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා පෝස්ටරයක් නිර්මාණය කිරීමට ඔබට පැවරී ඇත. එය නිර්මාණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු තුනක් විස්තර කරන්න. (ල. 03)

iv. වර්තමානයේ පෞද්ගලික ගුවන්විදුලි නාලිකා පිටපත් රචනයේ දී නොසැලකිළිමත් බවක් දක්වයි. පිටපත් රචනයේ දී සපුරාලිය යුතු කොන්දේසි හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

(05) i. පොත් සඳහා පමණක් සීමා වූ ලොව ප්‍රථම ප්‍රකාශන හිමිකම් නීතිය කුමක් ද? (ල. 01)

ii. නිශ්චල ඡායාරූපකරණයේ විශේෂතා දෙකක් ලියන්න. (ල. 02)

iii. නිර්මාණයක තිබිය යුතු පහත ගුණාංග විස්තර කරන්න. (ල. 03)

a. නැවුම් බව
b. සුවිශේෂී බව
c. අර්ථ සම්පන්න බව

iv. පාසලේ උදා ගුවන්විදුලි වැඩසටහනක් සඳහා යොදා ගත හැකි වැඩසටහන් ආකෘති හතරක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ල. 04)

(06) i. වඩා සුපැහැදිලි හඬ සම්ප්‍රේෂණයක් සඳහා වර්තමානයේ භාවිත කරන ගුවන්විදුලි තරංග වර්ගය කුමක් ද? ( ල.01)

ii. මුද්‍රිත මාධ්‍යයේ එන බාධක වර්ග දෙකක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

iii. සන්නිවේදනයේ ඓතිහාසික විකාශනය තුළ සිදු වූ වැදගත් සිදුවීම් තුනක් විස්තර කරන්න. (ල. 03)

iv. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලියේ දී ද්විමාර්ගික සන්නිවේදනයේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 04)

(07) i. පුවත්පතක සංස්කරණ අංශයේ ප්‍රධානියා නම් කරන්න. (ල. 01)

ii. විද්‍යුත් පුවත්පතක පොදු ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 02)

iii. ජනමාධ්‍ය විචාරයේ දී සංදේශය තුළින් ඉදිරිපත් වන අදහස කුමක් ද යන්න තීරණය වීම කෙරෙහි බලපාන සාධක තුනක් විස්තර කරන්න. (ල. 03)

iv. වගකීමෙන් යුතු සමාජ මාධ්‍ය පරිශීලකයෙකු ලෙස පිළිපැදිය යුතු ආචාර ධර්ම හතරක් පැහැදිලි කරන්න. (ල. 04)

PAST PAPERS WIKI
(5) WWW.PastPapers.WiKi (5)



Download Term Test Papers, Short Notes From One Place!

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
## 11 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| 1 - 2 | 11 - 4 | 21 - 4 | 31 - 4 | |
| 2 - 4 | 12 - 4 | 22 - 2 | 32 - 2 | |
| 3 - 1 | 13 - 1 | 23 - 3 | 33 - 1 | |
| 4 - 2 | 14 - 2 | 24 - 4 | 34 - 2 | |
| 5 - 3 | 15 - 3 | 25 - 4 | 35 - 3 | |
| 6 - 3 | 16 - 3 | 26 - 1 | 36 - 3 | |
| 7 - 1 | 17 - 2 | 27 - 3 | 37 - 1 | |
| 8 - 2 | 18 - 2 | 28 - 2 | 38 - 4 | |
| 9 - 3 | 19 - 1 | 29 - 4 | 39 - 4 | |
| 10 - 3 | 20 - 3 | 30 - 3 | 40 - 2 | (1x40 = 40) |

### II පත්‍රය

(01) i. බෙර හඬ, ගින්දර, කොළ අතු එල්ලීම, දුම, ගිනිමැලය ආදිය
ii. දොරටුපාල සංකල්පය
iii. අත් පත්‍රිකා, පෝස්ටර්, පොත් පිංච, බිත්ති සටහන් , ධාරා සටහන්, මාර්ග සංඥා ආදිය
iv. විජය පුවත්පත් ආයතනය, උපාලි පුවත්පත් ආයතනය
දවස පුවත්පත් ආයතනය, අරුණ පුවත්පත් ආයතනය ආදිය
v. වර්ණ අක්ෂර, ඡායාරූප, චිත්‍ර, අකුරු මෝස්තර, අකුරු ප්‍රමාණ ආදිය
vi. නිරවද්‍ය බව, සමතුලිත බව, වගකීමෙන් කටයුතු කළ යුතු බව, ආචාරශීලී බව ආදිය
vii. සාර්ථක ලෙස භාෂා භාවිතය, දේශීය සංස්කෘතිය ආරක්ෂා වීම, ශ්‍රාවකයා රැවටීමට ලක් නොකිරීම, යම් පුද්ගලයින්, ආයතන හෙළා දැකීමට ලක් නොවීම, කාලය ඵලදායීව අර්ථවත්ව භාවිතය, පෞද්ගලිකත්වයට සීමා වූ දේ මාධ්‍යයෙන් හෙළි නොකිරීම ආදිය.
viii. ජනමාධ්‍යවේදීන්ගේ ජාත්‍යන්තර සම්මේලනයේ ආචාර ධර්ම මාලාව, ශ්‍රී ලංකා කර්තෘ සංසදයේ වෘත්තීය ප්‍රතිපත්ති මාලාව, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ ආචාර ධර්ම ලේඛනය, නිදහස් මාධ්‍ය සංසදයේ ආචාර ධර්ම මාලාව
ix. වාර්තාවැඩසටහන්
x. සක්‍රීය ග්‍රාහකයා, නිෂ්ක්‍රීය ග්‍රාහකයා (ල. 2x10 =ල. 20)

(02) i. බලපෑම (ල. 01)
ii. ඍජු නිරීක්ෂණය , සහභාගීත්ව නිරීක්ෂණය (ල. 02)
iii. හොඳ නිරීක්ෂකයෙකු වීම, ආචාරශීලී බව, අපක්ෂපාතී බව යන ගුණාංග විස්තර කර තිබිය යුතුය. (ල. 03)
iv. නිල මූලාශ්‍ර මත ලබාගත් තොරතුරු ඉදිරිපත් කිරීම / නිවැරදිව ක්ෂණික තොරතුරු ලබාදීම / පවතින තත්වයන් අඛණ්ඩව වාර්තා කිරීම / ඉදිරි තත්වයන් පිළිබඳ නිල මූලාශ්‍ර මත අනාවැකි පළ කිරීම / භාව සංවේදී හැඟීම් ඇතිවන තොරතුරු ඉදිරිපත් නොකිරීම. (නම් කිරීමට ල. $\frac{1}{2}$ x 4 = ල. 2 ) (නම් කර විස්තර කර ඇත්නම් (ල.1x4= ල.4)

(03) i. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (ල. 01)
ii. මෙගා නාට්‍ය ප්‍රභේදයේ ලක්ෂණ විස්තර කළ යුතුය.
(අඩු වියදම් සහිතවීම / කොටස් වැඩි ගණනකින් යුතුවීම/ බොහෝ විට පටිගත කිරීම සිදුවන අතරතුර විකාශනය කිරීම)
iii. සමාජයේ විවිධ කණ්ඩායම් අතර සබඳතා ගොඩනැගීම (ල. 02)
උදා:- පාලකයා හා ජනතාව අතර, ව්‍යාපාරිකයා හා පාරිභෝගිකයා අතර, කලාකරුවා හා රසිකයා අතර
සමාජයට වන හානි දායක තත්ත්වයන් වැළැක්වීම.
උදා:- වංචා දූෂණ හෙළි කිරීම, ආපදා තත්ත්වයන් පිළිබඳ පෙර දැනුවත් කිරීම ආදිය.
දැනුම, තොරතුරු ලබාදීම.
උදා:- ප්‍රවෘත්ති, අධ්‍යාපන වැඩසටහන් ආදිය මඟින්
විනෝදාස්වාදය ලබාදීම තුළින් ආතතිය නැති කිරීම.
උදා:- නාට්‍යමය වැඩසටහන් , සංගීතමය වැඩසටහන් මඟින්
නව ජීවන රටා ඇති කිරීම.
උදා:- නව පරිභෝජන රටා, ආකල්ප ඇතිවීම. (නම්කර විස්තර කිරීමට ල. 03)
iv. පුද්ගල මූලාශ්‍ර, ආයතන මූලාශ්‍ර, මාධ්‍ය මූලාශ්‍ර, ලිඛිත මූලාශ්‍ර යන ඒවා උදාහරණ ඇසුරින් විස්තර කළ යුතුය.
(නම් කිරීමට ල. $\frac{1}{2}$ x 4 = ල. 2 ) (නම් කර විස්තර කර ඇත්නම් (ල.1x4= ල.4)


(2) WWW.PastPapers.WiKi (1)
Download Term Test Papers, Short Notes From One Place!

(04) i. සංජානනය (ල. 01)

ii. පාර හරහා මාරුවන පුද්ගලයෙකු දුටු විට බස් රථ රියදුරෙකු තිරිංග තද කිරීම, තරහක් ඇති වූ විට පුද්ගලයෙකුගේ මුහුණ කළුවීම, සර්පයෙකු දුටුවිට බිය වී ඉවතට පැනීම ආදී උදාහරණ දෙකක් දැක්විය හැකිය. (ල. 02)

iii. ආකර්ශණීය රූප හා සිත්තම් යොදා ගැනීම, ලොකු අකුරු යොදා ගැනීම, ක්ෂණිකව පෝස්ටරයේ අදහස ග්‍රහණය කරගත හැකි ලෙස නිර්මාණය කිරීම, ආකර්ෂණීය ලෙස වගන්ති නිර්මාණය කිරීම ආදී කරුණු තුනක් විස්තර කිරීම. (ල. 1x3 = ල.3)

iv. භාෂාවේ ස්වරූපය, ආමන්ත්‍රණ ස්වරූපය, ශ්‍රවණ ස්වරූපය, ශබ්ද ස්වරූපය යන කරුණු විස්තර කළ යුතුය. (නම් කිරීමට ල. 1/2 × 4 = ල.2) (නම් කර විස්තර කර ඇත්නම් ල.1x4= ල.4)

(05) i. රජිණගේ ව්‍යවස්ථාව (ල. 01)

ii. ගත වී යන කාලයෙන් එක් මොහොතක් නවතා ගැනීමට හැකිවීම, යමක් ඇසින් දැකගැනීමට හැකිවීම නිසා ග්‍රාහකයා තුළ වැඩි විශ්වාසයක් ජනිත කළ හැකිවීම. වචනයෙන් විස්තර කළ නොහැකි දේ ඡායාරූපයකින් ඉදිරිපත් කළහැකි වීම. (ල. 02)

iii. නැවුම් බව. සුවිශේෂී බව, අර්ථ සම්පන්න බව යනාදී කරුණු විස්තර කළ යුතුය ල.1x3= ල.3)

iv ප්‍රවෘත්ති වැඩසටහන්, සම්මුඛ සාකච්ඡා, සජීවී වැඩසටහන්, සංගීත වැඩසටහන් ආදී වැඩසටහන් හතරක් විස්තර කළ යුතුය. (නම් කිරීමට ල. 1/2 × 4 = ල.2) (නම් කර විස්තර කර ඇත්නම් ල.1x4= ල.4)

(06) i. F.M. තරංග (ල. 01)

ii. අර්ථ බාධක, මාධ්‍ය බාධක පුවත්පත ඇසුරින් නිදසුන් දක්වමින් විස්තර කළ යුතුය. (ල. 02)

iii. කථන භාෂාවක් සකස් කර ගැනීම, අක්ෂර නිර්මාණය කරගැනීම, භෞතික නිර්මාණය කරගැනීම, විවිධ දෑ යොදාගෙන ලිවීම, කඩදාසි නිර්මාණය කරගැනීම. මුද්‍රණ ශිල්පය සොයා ගැනීම, විදුලි හා විද්‍යුත් සංඥා තාක්‍ෂණය සොයා ගැනීම ආදී කරුණු තුනක් විස්තර කළ යුතුය.

ල.1x3= ල.3)

iv. ගුරුවරයාට හා ශිෂ්‍යයාට එකිනෙකා අවබෝධ කර ගනිමින් සන්නිවේදන කාර්යයේ නිරත විය හැකි වීම, එකිනෙකා අතර අන්තර් ක්‍රියාකාරී සම්බන්ධතාවයක් ඇති වීම, ප්‍රතිචාර ඒ අවස්ථාවේම ලැබෙන නිසා සන්නිවේදන කාර්යය ඵලදායී වීම, ප්‍රතිචාර ප්‍රතිපෝෂණය ලබාගත හැකි නිසා අඛණ්ඩව සන්නිවේදන කාර්යය පවත්වා ගෙන යාම, භාවාත්මක හැඟීම් ප්‍රකාශ කළ හැකි වීම ආදී කරුණු හතරක් විස්තර කළ යුතුයි. (නම් කිරීමට ල$\frac{1}{2}$ x 4 = 2) (නම් කර විස්තර කර ඇත්නම් ල.1x4= ල.4)

(07) i. ප්‍රධාන උප කර්තෘ (ල. 01)

ii. ක්ෂණිකව පුවත් දැන ගැනීමේ හැකියාව, ගබඩා කර තබා ගැනීමේ පහසුව, නැවත නැවත කියවිය හැකිවීම, තොරතුරු විෂයයන් අනුව වර්ග කරමින් පළ කොට තිබීම, යාවත්කාලීන කිරීමේ පහසුකම් ඇති වීම, ක්ෂණික පාඨක ප්‍රතිචාර ලැබීම. (ල. 02)

iii. මාධ්‍ය ආයතනයේ හිමිකාරීත්වය, මාධ්‍ය හා සම්බන්ධ ආර්ථික හා සමාජ සාධක, අදාළ කාලයේ පවතින දේශපාලන වාතාවරණය, සංස්කෘතික පසුබිම ආදී කරුණු තුනක් විස්තර කළ යුතුය. (ල. 1x3 = ල.3)

iv. තමා පිළිබඳ සත්‍ය තොරතුරු වසන් කරමින් අන් අය රැවටීමෙන් වැළකීම, වැරදි හා අසත්‍ය තොරතුරු ජාලයට එක් කිරීමෙන් වැළකීම, තමාගේ පෞද්ගලික තොරතුරු අනවශ්‍ය අය වෙත ලබාදීමෙන් වැළකීම, සමාජ සදාචාරයට හානි නොවන සේ භාවිත කිරීම, අන් අයගේ පෞද්ගලිකත්වයට හානි නොකිරීම ආදී කරුණු හතරක් විස්තර කළ යුතුයි. (නම් කිරීමට ල. 1/2 × 4 = ල.2) (නම් කර විස්තර කර ඇත්නම් ල. 1x4= ල.4)

PAST PAPERS WIKI



(2) WWW.PastPapers.WiKi (2)
Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න